OPERATIONS MANAGEMENT (Part-V)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

තොග පාලනය

නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩ ව කරගෙන යාම සඳහා ප්‍රශස්ත මට්ටමින් හා අවම පිරිවැයක් යටතේ තොග පවත්වා ගැනීම තොග පාලනය නමින් හැඳින්වේ.

ප්‍රශස්ත තොගය

ඌන හෝ අතිරික්ත හෝ තොග ඇති නොවන ආකාරයට අවම පිරිවැයක් යටතේ රඳවා ගන්නා තොග ප්‍රමාණය ප්‍රශස්ත තොගය යනුවෙන් අදහස් වේ.

ClassWork.LK

තොග පාලනයේ අවශ්‍යතාව

- නිෂ්පාදනය හා අලෙවි කටයුතු අඛණ්ඩ ව පවත්වාගෙන යාම.

- ඌන හෝ අතිරික්ත හෝ තොග පවත්වා ගැනීමෙන් සිදුවන වියදම අවම කර ගැනීම.

- යන්ත්‍ර සූත්‍ර හා ශ්‍රමය ආදි සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම.

- අනපේක්ෂිත ඉල්ලුම් තත්ත්වයන්ට සාර්ථක ව මුහුණ දීම.

ClassWork.LK

තොග පාලන ක්‍රම

තොග මට්ටම නිශ්චය කිරීමේ ක්‍රමය

උපරිම තොග මට්ටම, අවම තොග මට්ටම, යළි ඇණවුම් මට්ටම, ආර්ථික ඇණවුම් ප්‍රමාණය ආදි ලෙස විවිධ තොග මට්ටම් නිශ්චය කර ඒ අනුව තොග රැඳවා ගැනීමට උත්සාහ ගැනීම තොග මට්ටම් නිශ්චය කිරීමේ ක්‍රමය ලෙස හැඳින්වේ.

ClassWork.LK

ABC විශ්ලේෂණ ක්‍රමය

ද්‍රව්‍ය අයිතම විශාල සංඛ්‍යාවක් ඇති ආයතන බොහෝ විට තොග පාලනය සඳහා ABC විශ්ලේෂණ ක්‍රමය යොදා ගනී.

මෙම විශ්ලේෂණය ද්‍රව්‍ය අයිතමවල වටිනාකම හා අවශ්‍ය ඉඩකඩ මත සිදු වේ. වටිනාකමෙන් වැඩි, එහෙත් අයිතම සංඛ්‍යාවෙන් අඩු තොග A වශයෙන් ද මධ්‍යස්ථ වටිනාකමක් සහිත, මධ්‍යස්ථ අයිතම සංඛ්‍යාවක් සහිත තොග B වශයෙන් ද, අඩු වටිනාකමන් සහිත වැඩි අයිතම සංඛ්‍යාවක් සහිත තොග C වශයෙන් ද වෙන් කර ගෙන තොග පාලනය කිරීම මෙම ක්‍රමයේ දී සිදු වේ.

ClassWork.LK

මෙම අදහස පහත වගුව ඇසුරින් ද පැහැදිලි කළ හැකිය.

ද්‍රව්‍ය අයිතම	අවශ්‍ය ඉඩකඩ ප්‍රමාණය	වටිනාකම
A	10%	70%
B	30%	20%
C	60%	10%

ClassWork.LK

ද්විත්ව භාජන ක්‍රමය

විශාල හා කුඩා වශයෙන් භාජන දෙකක එක් වර්ගයක තොග රඳවා පළමු ව විශාල භාජනයේ තොග භාවිත කර එය අවසන් වූ පසු නැවත තොග ඇණවුම් කර එම තොග ලැබෙන තෙක් කුඩා භාජනයේ තොග භාවිත කිරීමෙන් තොග පාලනය කිරීම ද්විත්ව භාජන ක්‍රමය ලෙස හඳුන්වයි.

ඇණවුම් කරන ලද තොග ලැබුණු විට මුලින් ම කුඩා භාජනය පුරවා තබා පසුව විශාල භාජනය පුරවා පාවිච්චියට ගැනීම මෙහි විශේෂ ලක්ෂණයකි.

ClassWork.LK

අඛණ්ඩ ව තොග වාර්තා කිරීමේ ක්‍රමය

තොගයෙහි ඇති වන වෙනස් වීම් එලෙසින් ම වාර්තා කරන කවර අවස්ථාවක වුව ද ගබඩාවේ තිබෙන ශේෂය දැන ගත හැකි ආකාරයට තොග වාර්තා කිරීම අඛණ්ඩ තොග වාර්තා කිරීමේ ක්‍රමය ලෙස හැඳින්වේ. නිදසුන්, රාක්ක පත්‍රය (Bin Card) මේ ක්‍රමයේ දී ඒ ඒ ද්‍රව්‍ය අයිතමය වෙනුවෙන් වෙන් වෙන් වූ රාක්ක පත්‍ර භාවිත කරමින් තොග ලැබීම් හා නිකුත් කිරීම් ඒ අවස්ථාවේ දී ම එහි සටහන් කරනු ලබයි.

ClassWork.LK

පරිගණක වැඩ සටහන්

තොග පාලනය සඳහා නිපදවා ඇති පරිගණක මෘදුකාංග භාවිත කිරීම, පරිගණක වැඩසටහන් මඟින් තොග පාලනය කිරීම වේ.

JIT ක්‍රමය

නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය අවශ්‍ය වේලාවට නිවැරදි ප්‍රමාණයෙන් නිෂ්පාදන ක්‍රියාවලියට එකතු කිරීමේ හා නිමැවුම එසැණින් ම වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේ ක්‍රමය යි. අමු ද්‍රව්‍ය හා නිමි ද්‍රව්‍ය තොග ශූන්‍ය ලෙස පවත්වා ගනිමින් ගබඩා පිරිවැය අවම කර ගැනීමට උපයෝගී කර ගන්නා ක්‍රමයක් ලෙස ද මෙම ක්‍රමය හැඳින්විය හැකි ය.

නිෂ්පාදන පිරිවැයෙහි සැලකිය යුතු කොටසක් ඇතුළත් වන්නේ ගබඩා පිරිවැය වන බැවින්
ද අමු ද්‍රව්‍ය මෙන් ම නිමි භාණ්ඩ ද ගබඩා කිරීමක් සිදු නොවන බැවින් ගබඩා පිරිවැය අවම කරමින් JIT ක්‍රමය ක්‍රියාත්මක වේ.

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura